සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S I

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ......................................... චිත්‍ර කලාව - I කාලය : පැය 01යි.

සැලකිය යුතු යි.

* සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

- පහත සඳහන් පින්තූර ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(01) රූපයේ දැක්වෙන සිතුවම ............................................................. ලෙස නම් කර ඇත.

(02) මෙම සිතුවම නිර්මාණය කරන ලද්දේ ............................................................. නම් ශිල්පියා ය.

(03) මෙය ............................................................. මාධ්‍යයෙන් කැන්වසයක් මත නිම කරන ලද්දකි.

(04) සිතුවම සඳහා ශෛලිගත ලක්ෂණ හා ............................................................. ලක්ෂණවල අභාසය ලැබී ඇත.

(05) චිත්‍රය සඳහා බහුල වශයෙන් ............................................................. යොදා ගෙන ඇති අතර එහි ප්‍රභේද සමග දුඹුරු වර්ණය භාවිතයට ගෙන ඇත.

- අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර ලියන්න.

(06) වර්ෂ 1945 දී ප්‍රථම වරට ''ද ටයිම්ස් ඔෆ් සිලෝන්'' පුවත් පතට කාටූන් චිත්‍ර නිර්මාණය කළ ශිල්පියා කවු ද?

.......................................................................................................

(07) පහත රට බිතු සිතුවම් ඇඳීම සඳහා භාවිතා කළ සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමය කුමක් ද?

.......................................................................................................

(08) දඹුළු විහාරයේ බිතු සිතුවම් අඳින ලද්දේ කිනම් සිත්තර පරම්පරාව ද?

.......................................................................................................

(09) වියානා කලා කෞතුකාගාරයක ලී පුවරුවක් මත තෙල් සායම් මාධ්‍යයෙන් කළ රෆායෙල් සන්සියෝගේ ලෝ සුපතල සිතුවම කුමක් ද? ................................................................................................................

(10) ලංකා කලා සංගමයට අයත් අද්‍යතන යුගයේ චිත්‍ර ශිල්පියෙකු මහනුවර ප්‍රදේශයේ දෙව් මැඳුරක අගනා බිතු සිතුවම් රැසක් ඇඳ ඇත. එම ශිල්පියා නම් කරන්න.

.......................................................................................................................................

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) ශිව දෙවියන් කෙරෙහි ඇති අසාමාන්‍ය භක්තිය නිසා තම නාරි සෞන්දර්ය අහිමි කර ගත් අශෝභන තැනැත්තියක් වූ කාන්තාවකගේ රුවක් අංක 05 සිට ශිව දෙවොලින් හමු විය. එම මූර්තිය වනුයේ,

(1) ශිව කාමසුන්දරී මූර්තිය වේ. (2) කාරයික්කාර් අම්මයියාර් මූර්තිය වේ.
(3) සුන්දර මූර්ති ස්වාමි මූර්තිය වේ. (4) සෝමස්කන්ධ මූර්තිය වේ.

(12) ඇඳුම් පැළඳුම්, සංගීත භාණ්ඩ, ගෘහ නිර්මාණ අංග හා ගෘහ භාණ්ඩ මෙන් ම විනෝදාංශ ද යුරෝපීය ලක්ෂණවලට අනුගතව අඳිනු ලැබූ ''මහා ධන සිටුවරයාගේ කථාව'' චිත්‍රයට නගා ඇති පහත රට විහාරය වනුයේ,

(1) කතළුව විහාරය (2) කරගම්පිටිය විහාරය
(3) බොරැල්ලේ ගෝතමී විහාරය (4) නව කැළණි විහාරය

(13) ලෝකඩ මාධ්‍යයෙන් වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය අනුව කරන ලද උද්‍යාන මූර්තියක් වන ''රජ පවුල'' නම් මූර්තිය නිර්මාණය කරන ලද්දේ,

(1) තිස්ස රණසිංහ ශිල්පියා ය. (2) පැබ්ලෝ පිකාසෝ ශිල්පියා ය.
(3) හෙන්රි මුවර් ශිල්පියා ය. (4) ඕගස්ට් රොඩීන් ශිල්පියා ය.


(14) තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියා විසින් ළා පැහැයට හුරු දුඹුරු වර්ණ මාලාවකින් ගාම්භීර පෙනුමක් සහිතව කුකුළාගේ රුව මනාව සිතුවම් කර ඇති ''සුදු කුකුළාගේ රූපය'' ඇති ස්ථානය වන්නේ,

(1) නල්ලූර් කෝවිල ය. (2) කෝනේශ්වරම් කෝවිල ය.
(3) ඉනුවිල් කෝවිල ය. (4) සට්ටනාදර් ශිව දේවාලය ය.

(15) දකුණු ඉන්දීය විජය නගර් ගෘහ නිර්මාණ කලා ලක්ෂණ පෙන්නුම් කෙරෙන ගම්පල යුගයට අයත් ගඩලාදෙණිය විහාරයේ ගෘහ නිර්මාණ ශිල්පියා වන්නේ,


(1) ගණේශ්වරාචාර්ය ශිල්පියා ය. (2) ස්ථපතිරායර් ශිල්පියා ය.
(3) දේවේන්ද්‍ර මූලාචාරී ශිල්පියා ය. (4) සිවඥාන සුන්දරම් ශිල්පියා ය.

- **අංක 16 සිට 20 දක්වා දී ඇති රූප සටහන්වලට ගැළපෙන රූප සටහන් A, B, C, D, E අතුරෙන් තෝරා ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.**

(16)  (............................)  **A**

(17)  (............................)  **B**

(18)  (..............................)  C

(19)  (..............................)  D

(20)  (..............................)  E

- **අංක 21 සිට 25 තෙක් දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(21) ඝන කැපීම, ලකුණු කැපීම ආදී ශිල්ප ක්‍රම භාවිතා කොට කරන නිර්මාණ අයත් වන්නේ .................................................... කර්මාන්තය සඳහා ය.

(22) ''ආදම් මැවීම'' නැමති ලෝ සුපතල බිතු සිතුවම මයිකල් ඇන්ජිලෝ ශිල්පියා විසින් .................................................... වියන් තලයෙහි අඳින ලද සිතුවමකි.


(23) A - මාර්ක් ශිල්පියා විසින් පැස්ටල් මාධ්‍යයෙන් වර්ණ ගන්වන ලද ඝණිකවාදී ශෛලීය ලක්ෂණ සහිත .................................................... සිතුවම සුවිශේෂී කලා නිර්මාණයක් ලෙස සැලකේ.

(24) තිවංක පිළිමගෙයි ''දේවාරාධනය'' නම් සිතුවම අන්තරාලයේ ඇති සුවිශේෂී එකක් වන අතර බුදුන් වහන්සේ සංකස්ස පුරයට වැඩම කිරීම චිත්‍රය දැකිය හැක්කේ ........................................................................................ දී ය.

(25) එකම වර්ණයක ප්‍රභේද භාවිතා කරමින් අඳිනු ලබන චිත්‍ර ........................................................................................ චිත්‍ර ලෙස නම් කෙරේ.

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**


F


G


H


I


J

(26) F අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය කළුගල් මාධ්‍යයෙන් නිමවා ඇති අතර බුදුන් වහන්සේගේ කිනම් ගුණයක් මින් නිරූපිත බව පැවසේ ද? ..............................

(27) G අක්ෂරයෙන් දැක්වෙන පිළිමය හඳුන්වන නම කුමක් ද? ..............................

(28) H අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය කිනම් යුගයකට අයත් වූවක් ද? ..............................

(29) I අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය අපට දැක ගත හැකි ස්ථානය කුමක් ද? ..............................

(30) J අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය කිනම් කලා සම්ප්‍රදායකට අයත් වේ ද? ..............................

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

(31) හර්මිකාව : ..............................


(32) ත්‍රිමාණ ලක්ෂණ : ..............................

(33) ගොකටු කිරි : ..............................

(34) තහඩු වැඩ : ..............................

(35) මස්ජිදය : ..............................

- **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා රූප සටහන ඇසුරු කර ගනිමින් උප ශීර්ෂවලට අනුව වාක්‍ය පහක් (05) ලියන්න.**



(36) හඳුනාගත් බව :

..............................

..............................

(37) මාධ්‍ය හා ශිල්ප ක්‍රමය :

..............................

..............................

(38) යුගය :

..............................

..............................

(39) කලා සම්ප්‍රදාය :

..............................

..............................

(40) භාව ප්‍රකාශනය :

..............................

..............................

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

| 43 | S | II |
|---|---|---|

# දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : .......................................... **චිත්‍ර කලාව - II** කාලය : පැය 02යි.

**සැලකිය යුතු යි.**

- **ඔබේ විභාග අංකය උත්තර පත්‍රයේ පසුපිටේ පැහැදිලිව සටහන් කරන්න.**
- **උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැක.**
- **දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය.**
- **සියලු ම ද්‍රව්‍ය ඇස් මට්ටමින් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.**

◆ **නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිඩනය**

ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

1. රේඛා මඟින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා රළු කඩදාසියක් භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

◆ මෙම චිත්‍ර දෙකම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

◆ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

◆ රේඛා අධ්‍යයනය

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වන කුසලතා

◆ වර්ණ චිත්‍රය

1. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම.
2. පරිමාණ, පර්යාවලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
3. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
4. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව
5. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

◆ **සැලකිය යුතුයි.**

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහය ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

43 | S | III

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 11 - 2019

**නම/විභාග අංකය : ..........................................** **චිත්‍ර කලාව - III** **කාලය : පැය 02යි.**

**සැලකිය යුතු යි.**

- **ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.**
- **ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය අත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති තීරුවේ පැහැදිලිව ලියන්න.**
- **උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය.**
- **දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැක.**
  **(ෆෙල්ට් පැන් භාවිතය සුදුසු නැත.)**

- **''අ'' කොටසින් හෝ ''ආ'' කොටසින් හෝ ''ඉ'' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.**

### ''අ'' කොටස - චිත්‍ර සංරචනය

1. වෙසක් දින රාත්‍රියේ ගමේ පන්සල
2. අභය භූමියක සතුන් නරඹන පිරිසක්
3. මුහුදු යාමට සැරසෙන ධීවරයෝ
4. කුඹුරේ අස්වනු නෙලන ගොවි ගෙවිලියෝ

### ''ආ'' කොටස - මෝස්තර නිර්මාණය

5. මල්, කොළ පොහොට්ටු යොදා ගනිමින් ගවුම් රෙද්දකට ව්‍යාප්ත මෝස්තරයක් අඳින්න.
6. පාරම්පරික සිංහ සැරසිළි මෝස්තර යොදා ගනිමින් පින්තල බන්දේසියක් සැරසිලි කරන්න.
7. නිර්මාණාත්මක සැරසිළි ඒකක භාවිත කරමින් සාරි පල්ලුවක් නිර්මාණය කරන්න.

### ''ඉ'' කොටස - චිත්‍ර සංරචනය

8. ''ත්‍රස්තවාදය පිටු දකිමු.'' මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
9. අලුතින් වෙළෙඳ පොළට හඳුන්වා දෙන සුවඳ සබන් වර්ගයක් සඳහා දවටනයක් නිර්මාණය කරන්න.
10. උපන් දින සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

43 S II

# දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019


# Second Term Test - Grade 11 - 2019

චිත්‍ර කලාව - II    කාලය : පැය 02යි.

ශාලාධිපති උපදෙස් :

අවශ්‍ය ද්‍රව්‍ය :

- කාඩ්බෝඩ් පෙට්ටියක්
- මැටි කලයක් කුඩා ප්‍රමාණයේ
- ක්‍රෝටන් අත්තක් පත්‍ර 05ක් සහිත (විශාල පත්‍ර සහිත වර්ණවත්)
- කොටු හෝ ඉරි සහිත අත් පිස්නාවක්
- තැඹිලි ගෙඩියක්
- ඩ්‍රෝවින් බෝර්ඩ් එකක්



Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 11 - 2019

# චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

(1) - කියවන ළමයා
(2) - K. කනකසභාපති
(3) - තෙල් සායම්
(4) - සංකේතවාදී කලා
(5) - කොළ
(6) - ඔබ්රි කොලට්
(7) - ප්‍රෙස්කෝ සීකෝ / වියළි බදාමය මත චිත්‍ර ඇඳීම.
(8) - නීලගම සිත්තර පරම්පරාව
(9) - තණ පිටියේ මැඩෝනා
(10) - ඩේවිඩ් පේන්ටර්
(11) - (2)
(12) - (1)
(13) - (3)
(14) - (4)
(15) - (1)
(16) - C
(17) - A
(18) - E
(19) - B
(20) - D
(21) - වෙස් මුහුණු කර්මාන්තය
(22) - සිස්ටයින් දෙව් මැදුරෙහි
(23) - සකුන්තලා
(24) - ගර්භ ගෘහයෙහි
(25) - මොනෝක්‍රෝම්
(26) - මහා කාරුණික භාවය
(27) - තොලුවිල පිළිමය
(28) - මහනුවර යුගයට
(29) - පොළොන්නරු වටදාගෙය
(30) - අමරාවතී කලා ලක්ෂණ
(31) - සාංචි ස්තූපයේ ගර්භයට ඉහළින් හර්මිකාව පිහිටා ඇත.
(32) - එළිය හා අඳුර දැක්වීම ත්‍රිමාණ ලක්ෂණ පෙන්වීම නම් වේ.
(33) - මහනුවර ශිල්පියා කහ වර්ණය තනා ගත්තේ ගොකටු ගසේ කිරි වලිනි.
(34) - පිත්තල කර්මාන්තයේ එන එක් භාණ්ඩ නිපදවීමේ ශිල්ප ක්‍රමයකි.
(35) - මස්ජිදය යනුවෙන් හඳුන්වන්නේ මුස්ලිම් පල්ලියයි.
* නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.
(36) - මෙය පොළොන්නරු ගල් විහාරයේ / උත්තරාරාමයේ ඇති හිටි බුද්ධ ප්‍රතිමාවයි.
(37) - මෙය කළු ගල් මාධ්‍යයෙන් අධි උන්නතව නෙලා ඇත.
(38) - පොළොන්නරු යුගයට අයත් වේ.
(39) - පල්ලව කලා ලක්ෂණ දක්නට ලැබේ.
(40) - බුදුන් වහන්සේ අපිරිමිත දයා කරුණාව අනුන්ගේ දුකෙහි දී දුක්වන බව මෙම පිළිමයෙන් නිරූපිත බව විචාරක මතයයි.
(එක් ප්‍රශ්නයකට 1 ලකුණ බැගින් 1 x 40 = 40)

## II පත්‍රය ස්වභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය ලකුණු දීමේ නිර්නායක

| | | |
|---|---|---|
| 01. | රේඛා අධ්‍යයනය ලකුණු 05 | |
| 02. | ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව | ලකුණු 05 |
| 03. | ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | ලකුණු 05 |
| 04. | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය | ලකුණු 05 |
| | (පර්යාවලෝකය ත්‍රිමාණ ලක්ෂණ ඇස් මට්ටම අවකාශ භාවිතය | |
| 05. | වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | ලකුණු 05 |
| 06. | චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව | ලකුණු 05 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | ලකුණු 30 |

II වන පත්‍රය සඳහා හිමි ලකුණු ලකුණු 30

**Answer**

## III පත්‍රය ''අ'' කොටස චිත්‍ර සංරචනය

ලකුණු දීමේ නිර්නායක

| | | |
|---|---|---|
| (1) | තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශ කර ඇති අයුරු | ලකුණු 06 |
| (2) | මානව රූප හා සත්ත්ව රූ ඇතුළු සියලු හැඩතල මත සමපිණ්ඩනය කර ඇති අයුරු | ලකුණු 06 |
| (3) | සිද්ධාන්ත භාවිතය | ලකුණු 06 |
| (4) | වර්ණ භාවිතයේ කුසලතා | ලකුණු 06 |
| (5) | අනුමත ශෛලියට අනුව චිත්‍රයේ සමස්ත නිමාව | ලකුණු 06 |
| | මුළු ලකුණු | **ලකුණු 30** |

## III පත්‍රය ''ආ'' කොටස මෝස්තර හා සැරසිලි නිර්මාණය

ලකුණු දීමේ නිර්නායක

| | | |
|---|---|---|
| (1) | මාතෘකාවට හා කාර්යයට උචිත අයුරින් නව්‍යතාකින් යුතුව සැලසුම් කිරීම | ලකුණු 06 |
| (2) | පාරිභාරික අවශ්‍යතාවන්ට ගැළපෙන බව | ලකුණු 06 |
| (3) | නිර්මාණාත්මක බව හා හැඩතල සම්පිණ්ඩනය කිරීමේ හැකියාව | ලකුණු 06 |
| (4) | උචිත වරණ තෝරාගෙන භාවිත කිරීමේ හැකියාව | ලකුණු 06 |
| (5) | විචිත්‍රත්වය, චමත්කාර ජනක බව, සමස්ත නිමාව | ලකුණු 06 |
| | මුළු ලකුණු | **ලකුණු 30** |

## III පත්‍රය ''ඉ'' කොටස ග්‍රැෆික් චිත්‍ර

ලකුණු දීමේ නිර්නායක

| | | |
|---|---|---|
| (1) | මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් සැලසුම් කිරීම. | ලකුණු 06 |
| (2) | වාණිජමය හා කර්මාන්තයට උචිත අයුරින් සැලසුම් කිරීම. | ලකුණු 06 |
| (3) | රේඛා හා හැඩතල හා සැරසිලි අර්ථවත්ව භාවිත කිරීමේ හැකියාව | ලකුණු 06 |
| (4) | උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීම. | ලකුණු 06 |
| (5) | විචිත්‍රත්වය, චමත්කාර ජනක බව, සමස්ත නිමාව | ලකුණු 06 |
| | මුළු ලකුණු | **ලකුණු 30** |

| | |
|---|---|
| I පත්‍රය සඳහා | ලකුණු 40 |
| II පත්‍රය සඳහා | ලකුණු 30 |
| III පත්‍රය සඳහා | ලකුණු 30 |
| | **මුළු ලකුණු 100** |